## සිංහලයන් දූන් ඉන්දියනු සාගරයේ යුදෙව්වෝ වගේ

ජනතා විමුක්ති පෙරමුණ මහින්දව සංසන්දනය කළේ පස්වන මිහිඳු රජුටයි. මෙය අද ඊයේ නොව එදා විජේවීර යොදාගත්ත කථාවක්. එදා ජේ.ආර් ගැන සඳහන් කළේද ඔය කථාවමයි. යුද්ධ හොඳට නොකරන එකට දොස් පවරන එක වැඩියෙන් උග්‍ර නුනේ මෑතදී. විමල් වීරවංශ මෙහෙම කිව්වා,
"අප අසා ඇති පරිදි හතරවැනි මිහිඳු රජු නම්, එදා තම රාජ්‍යයට එරෙහිව ආ සොළී ආක්‍රමණයට සාර්ථකව මුහුණ දී ජයගත්තේය. එහෙත් පස්වන මිහිඳු රජු නම් පරාජය කොට රැගෙන යාමට ආක්‍රමණයට හැකිවිය."
මේ අනුව මහින්ද යන්නේ මෙයින් කාගේ මාවතේද කියන ප්‍රශ්නයයි විමල් අහන්නේ. මේ සැසැඳීමේ තිබෙන ලොකුම ගැටළුව උතුරේ දෙමළ සටන ආක්‍රමණයක් වුණේ කොහොමද කියන එකයි. දෙමළුන් වූ පළියට ඔවුන් ඉන්දියානු ආක්‍රමණිකයන් වෙන්නේ නෑ. අද චෝල හා පාණ්ඩියන් සියළු වර්ගයන් සහිත ඉන්දියානුවන්ගේ රාජ්‍යය කරන්නේ මහින්දට උදව් කිරීමයි. එදා මංකි හමුදාව (වඳුරු හමුදාව) ලෙසට විමල්ලාම හැඳින් වූ ඉන්දියන් හමුදාව කරන්නේ ලංකාව වටේ දැල් දාගෙන කොටින්ගේ බෙල්ල මිරිකන එකයි. එදත් මංකි හමුදාව ලංකාවට ගොඩබැස්සේ කොටින්ට උඩගෙඩි දෙන්න නෙවෙයි. මංකියා ආවේ කොටියා හමගහන්නයි. එදා විමල්ලා දකුණේ වළිකෑවේ මංකියා හමගහන්නටයි. අදත් මංකි හමුදාව එදාටත් වඩා හොඳින් කොටියාව කොටු කරගන්නට උදව් වෙනවා.

තව පැත්තකින් විමල්ලා කියන්නේ කොටි සංවිධානය ඇමරිකන් මෙහෙයුමක් බවයි. විමල් මෙහෙම කියනවා.
"මානව හිමිකම් උල්ලංඝනය වීම නමැති වර ගන්වා අතිශයෝක්තියෙන් යුතුව ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්නය දඩමීමා කරගනිමින් ආරක්ෂක හමුදාවන්ගේ ඉදිරි මෙහෙයුම් නතර කරවීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ඇමරිකානු එක්සත් ජනපදය ඇතුළු අධිරාජ්‍යවාදී රටවල් හරහා ශ්‍රී ලංකා රාජ්‍යයට බලපෑම් එල්ල කිරීමයි.
ඒ වගේම ගුණදාස අමරසේකර මෙහෙම කියනවා.
"ඉන්දියාව පෝෂණය කළ කොටි ත්‍රස්තවාදය මේ බටහිර අධිරාජ්‍යවාදය විසින් වැඩිදුරටත් පෝෂණය කිරීම අපට අත්දැකීමෙන් දකින්න පුළුවන්."

මේ කථාවල් ඇහැව්වහම බඩ අල්ලන් හිනා වෙන්නේ ඇමරිකන් අධිරාජ්‍යවාදීන් විතරක් නෙවෙයි. මහින්ද, මිලින්ද, බෝගොල්ලාගම හා ගෝඨාභය ආදී ඇමරිකන් හිතවාදීන් මෙන්ම බුෂ්ලාද හිනා වෙනවාට සැක නෑ. මොකද? අද ඇමරිකාවත් ඉන්නේ මහින්දගේ කෙරුවාවවල් සමඟ නිසයි. අද යැංකි වැඩපිළිවෙල යන්නේ මහා පරිමාණ ඊනියා සංවර්ධන වැඩපිළිවෙල තුළ පමණක් නොවෙයි. යුධමය කටයුතු මෙහෙයවන්නත් යැංකි - මංකි උවමනාව හා මැදිහත් වීම උඩයි. ටැමිල් වෙල්වම් මරා දැමීමට දමපු ඉහළ තාක්ෂණික වැඩපිළිවෙල තුළ යැංකි - මංකි මැදිහත්වීම පෙනෙනවා. ඒ දුර යන්න අවශ්‍ය නෑ. ඇමරිකාව මානව හිමිකම් උල්ලංඝනය ගැන කථා කරලා තියෙන්නේ ඒවා දුරදිග ගියොත් යුධ ආධාර නවත්වන බවයි. ඒ අනුව යුද්ධය කෙරෙන්නේ කාගේ මැදිහත් වීමෙන්ද, ආධාරයෙන්ද කියලා පැහැදිලියිනේ. සිංහලයන් දූන් ඉන්දියනු සාගරයේ යුදෙව්වෝ වගේ.

ඇමරිකාවේ ලොකුම බලය මැදපෙරදිගදී යුදෙව්වෝ. ඊශ්‍රායලයට යම් යම් බලපෑම් යැංකි නායකයෝ කරන එක ඇත්ත. ඒ වුණත් මානව අයිතීන් හා පලස්තීනුවන්ගේ අයිතිය ගැන මොන ආඩපාලි කිව්වත් ඊශ්‍රායලයේ යුධ බලය තිබෙන්නේ ඇමරිකන් ආධාර මත. ඒ නිසාම ඔවුන් ජීවත් වෙන්නේ යැංකි සැලැස්ම තුළ.
දැන් ලංකාව තුළ සිංහල ජාතියත්, රජයත් වැටිල තියෙන්නේ ඒ තත්වයටමයි. යැංකි-මංකි ගෝලීය බලවතුන්ගේ අතේ නැටවෙන රූකඩ බවට සිංහල ජාතියත්, රජයත් වැටිල ඉන්නේ. කොටිය, කොටිය කියා කෑගහන විමල්, ගුණදාස කල්ලියේ බෙල්ලට යැංකි - මංකි තොණ්ඩුව වැටිල කියලා නොතේරෙන එක තමයි පුදුමේ.

ගුණදාසයා මෙහෙමත් කියනවා.
"නව යටත් විජිතවාදීන්ගේ ඊළඟ උපක්‍රමය වන්නේ, ඔවුන්ගේ නව ලිබරල්වාදී ආර්ථික රටාව මෙහි ව්‍යාප්ත කිරීමයි. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ඔවුන් විසින් සපයනු ලබනවා."
මේ ගුණදාසයාගෙන් අපට අහන්න වෙනව මේක මේ මොහොතේ ක්‍රියාත්මක වෙනවද නැද්ද කියලා. ඊනියා විශාරද හෝ පණ්ඩිතකම් නැතුවත් අපට නම් හොඳටම පෙනෙන්නේ මහින්ද රජය අකුරටම ඔය කියන නව යටත් විජිතවාදි වැඩේට බෙල්ලෙන් අහුවෙලා බවයි. දැනටමත් විදේශ ණය මාර්කට් එකෙන් ගනිමින් රනිල්ටත් එහා ගිහින් වහල් නායකයෙක් වෙලයි ඉන්නේ. මේ ආයෝජන සියල්ල වෙනුවෙන් මහින්ද රජය රැකගෙන සියළු අභියෝග තලා දමන්න ගෝලීය බලවතුන් ගිවිසුම් අත්සන් කරලා තියෙනවා. වංශලා, දාසලා මේවා දන්නේ නැත්ද, නැත්නම් දනගෙන පල් බොරු කෙළිනවද?

මහින්ද ගෝලීය ආර්ථික න්‍යාය පත්‍රය බලවතුන්ට උවමනා විදියට හොඳට ගෙනියනවා. ඒ අනුව ගෝලීය බලවතුන්ගේ උවමනාව අනුව යුද්ධයත් ගෙනියනවා. දේශපාලන බලයත් වවාගෙන යනවා. තව මොනවද යැංකින්ට මංකින්ට ඕනෑ. උන්ට ඕනෑ හැම දේම ගෙඩි පිටින් දෙනව නම් උන්ට රනිල් වැඩක් නෑ. උන් රනිල්ට කියන්නෙත් උඹ කොහොම හරි මේකෙම එල්ලියන් කියලයි. ඒ නිසාම රනිල් උත්සාහ කරන්නේ මහින්ද පෙරළන්න නෙමෙයි. එයාට ඕනෑ මහින්දගේ අගමැති වෙන්න. එහෙම වෙලා මේ ගේම් එක හොඳට ගෙනියන්න.

ඊනියා දේශප්‍රේමී රජය උතුරේ දෙමළ කැරළි නායක ටැමිල් චෙල්වම් මරපු දවසෙම කොටුවේ උපාධිධාරීන්ට අම්බානට තැලුවා. ඒ බැට දීපු හැටියට ඊළඟට මේ තරුණ තරුණියෝ අවිආයුධ අරගෙන පෙළපාලි යන්නට ආවොත් මං පුදුම වෙන්නේ නෑ. මේ පෙළපාලියේ නායකත්වය ගත්තේ ජනතා විමුක්ති පෙරමුණේ තරුණ නායකයෝ. කේ.ජේ. ගේ පුතා තමා අදහස් දැක්වූවෙත්. වාසුදේව හොම්බ ඉස්සරහම තියාගෙන නිමල් සිරිපාල ඇමතිතුමා කියනව ඇතැම් වෘත්තීය සමිති මැරවරයින්ගේ අතකොළු වෙලා කියලා. ඊට ඉස්සෙල්ලා කියලා තිබුණා වෘත්තීය සමිති නායකයින් අංගොඩ අරින්න ඕන කියලත්. තව තැනක කිව්ව මුන් වඳුරෝ කියලත්. මේ කියන්නේ වාසුදේවගේ වෘත්තීය සමිති හෙංචයියන්ට වෙන්න බෑ. මෙසේ කියන්නේ විමල්ලාගේ වෘත්තීය සමිති ගැනත් වෙන්න පුළුවන් බව මතක තියා ගත්තොත් හොඳයි. නැත්නම් මේවා මතක් වෙන්නේ බෙල්ලෙන් අල්ලලා කූඩුවේ දැම්ම වෙලාවටයි.